# සිකුරාදා

## පළමුවන කියැවීම

ජෙරමියා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ජෙරමියා 20 : 10-13

**සමිඳාණෝ මහා බලවන්තයකු සේ මා සමඟ සිටින සේක.**

කසු කුසුව මට ඇසේ. අවට ඇත්තේ භීතියකි. 'අපි ඔහු ප්‍රතික්ෂේප කරමු. ප්‍රතික්ෂේප කරමු' කියා මාගේ හිත මිතුරෝ පවා කියති. මාගේ වැටීම ද ඔව්හු බලා සිටිති. 'සමහරවිට ඔහු රැවටෙනු ඇත. එවිට ඔහු පරාජය කොට ඔහුගෙන් පළිගන්නට අපට පුළුවනැ'යි ඔව්හු කියති. එහෙත් සමිඳුනි, ඔබතුමාණෝ මහා යුද වීරයෙකු සේ මා සමග සිටින සේක. එබැවින් මාගේ පීඩාකාරයෝ පැකිළෙන්නෝ ය. ඔව්හු ජය නොගන්නෝ ය. ඔවුන්ට ජය ගැනීමට බැරි නිසා ඔව්හු ලැජ්ජාවට පත් වන්නෝය. එය කවදාවත් අමතක නොවන සදාකාල අවනම්බුවක් වන්නේය. සව් බලැති සමිඳුනි, සැදැහැවතුන් පිරික්සන මාගේ සතුරන්ගේ සිත හද විනිවිද දකින ඔබතුමාණන් මාගේ සතුරන්ගෙන් පළිගනු දැකීමට මට වර දුන මැනව. මම මාගේ විනිශ්චය ඔබ අතට පවරන්නෙමි. සමිඳුන්ට ගී ගයන්න. එතුමාණන් පසසන්න. මන්ද එතුමාණෝ නපුරු මිනිසුන්ගේ අතින් පීඩිත වූවන් මුදාලන සේක.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 18 : 1 – 6

පිළිතුර: මාගේ විපතේ දී සමිඳුන්ට අයදිමි. එතුමාණෝ මට සවන් දෙන සේක.

ගීය:

මාගේ සවි ශක්තිය වන සමිඳුනි, මම ඔබට ප්‍රේම කරමි. සමිඳාණෝ මාගේ පර්වතය ය. බලකොටුව ය. මිදුම්කාරයාණෝ ය. ඔබ මා දෙවිඳාණෝ ය. පර්වත රජිඳාණෝ ය. මම ඔබ සරණ කොට ගනිමි. ඔබ මට පළිහ ය. ගැලවීමේ බලය ය. උස් කොටු පවුර ය.

සියලු පැසසුම්වලට හිමිකම් ඇති සමිඳුනි, මම ඔබට අයැද සිටිමි. මෙසේ මාගේ සතුරන්ගෙන් මම ගැලවෙන්නෙමි. මරහුගේ රැහැන් මා වෙළාගත්තේ ය. වනසන ජලධාරා මා ගිල ගත්තේය.

පාතාල රැහැන මා වෙළාගති. මරණයේ මළපත් මට අටවා තිබිණි. මාගේ විපතේ දී සමිඳුන්ට අයැදිමි. මාගේ දෙවිඳුන්ට මොරගැසීමි. එතුමාණෝ සිය මාළිගාවේ සිට මා හඬට සවන් දුන් සේක. මා යාදිනි එතුමන් වෙත නැගිණි.

## සාධුකාරය

"මා ඔබට වදාළ වචන ආත්මය ද ජීවනය ද වෙයි. සදාතන ජීවනයේ වචනය ඇත්තේ මා වෙත ය.

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 10 : 31−42

***ඔව්හු උන් වහන්සේ අල්ලා ගැනීමට උත්සාහ කළහ. එහෙත් උන් වහන්සේ ඔවුන් අතින් මිදී ගිය සේක.***

ජේසුස් වහන්සේට ගසන්නට ජුදෙව්වරු නැවත ගල් අතට ගත්හ. එවිට ජේසුස් වහන්සේ කතා කොට, "පියාණන් වහන්සේ කරණකොටගෙන බොහෝ යහපත් ක්‍රියා ඔබට දැක්වීමි. එයින් කවර ක්‍රියාවක් නිසා ඔබ මට ගල් ගසන්නාහු දැ"යි ඇසූ සේක. ජුදෙව්වරු උන් වහන්සේට පිළිතුරු දෙමින්, "අප ඔබට ගල් ගසන්නේ යහපත් ක්‍රියාවක් නිසා නොව, ඔබ කළ දේවාපහාසාය නිසාය. මිනිසෙකු වන ඔබ දෙවියන් වහන්සේ වෙන්නට බලන නිසා ය"යි කීහ. ජේසුස් වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින් "ඔබ දෙව්වරු යයි කීමි" යි ඔබේ ව්‍යවස්ථාවලියේ ලියා තිබෙනවා නොවේද? එය ප්‍රතික්ෂේප කළ නොහැකිය. ඒ ශුද්ධ ලියවිල්ලේ කියා ඇති පරිදි දෙවියන් වහන්සේගේ වචනය දෙනු ලැබූවන්ට දෙව්වරු ය"යි උන් වහන්සේ වදාළ සේක. ඒ ශුද්ධ ලියවිල්ල ප්‍රතික්ෂේප කළ නොහැකි ය. එසේ නම් දෙවියන් වහන්සේ විසින් කැප කරනු ලැබ ලොවට එවන ලද තැනැත්තා වන මා 'මම දෙවියන් වහන්සේගේ පුත්‍රයා යි' කී නිසා 'ඔබ දේවාපහාස කරන්නෙහි ය'යි මා ගැන කියන්නහු ද? මම මාගේ පියාණන්

වහන්සේගේ ක්‍රියා නොකරම් නම් මා විශ්වාස නොකරන්න. එහෙත් මම ඒවා කරම් නම් ඔබ මා විශ්වාස නොකරතත් මාගේ ක්‍රියා විශ්වාස කර පියාණන් වහන්සේ මා තුළ ද, මා පියාණන් වහන්සේ තුළ ද සිටින බව අවසාන වශයෙන් දැනගන්නැ" යි කී සේක.

නැවතත් ඔව්හු උන් වහන්සේ අල්ලා ගන්නට උත්සාහ කළහ. එහෙත් උන් වහන්සේ ඔවුන් මඟහැර ගිය සේක. උන්වහන්සේ ජෝර්දානෙන් එගොඩ ජුවාම් පළමුවෙන් බෞතීස්ම ස්නාපනය කරමින් සිටි ස්ථානයට යළිත් ගොස් එහි නැවතී ගිය සේක. බොහෝ දෙනෙක් උන් වහන්සේ වෙතට පැමිණ "ජුවාම් කිසි හාස්කමක් නොකළ නමුත් ජේසුස් වහන්සේ ගැන ජුවාම් කී සියල්ලම සැබෑ ය"යි කීහ. එහිදී බොහෝ දෙනෙක් උන් වහන්සේ අදහා ගත්හ.

සුවිශේෂ වාක්‍යය එසේ ය.